දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී පිළිගත් මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීම යෝග්‍ය බව Ethics Eye අප විසින් නිතරම අවධාරණය කරන කරුණකි. දිවි තොර ගැනීමේ පුවත් හරහා පාඨකයාට මෙන්ම, විපතට පත් පුද්ගලයාගේ පවුලේ අයට ද ඇති විය හැකි බලපෑම මෙයට හේතුවයි.

අරුණ සහ දිවයින පුවත්පත් වල (12/08) පළ වූ එකම දිවි තොර කරගැනීමේ සිදුවීමක සහ මව්බිම පුවත්පතේ (12/09) පළවූ තවත් දිවි තොර කරගැනීමක පුවත් වාර්තා නිරීක්ෂණය කිරීමේදී , දිවි තොර කරගැනීම් වාර්තාකරණයට අදාළ මාධ්‍ය ආචාර ධර්ම කිහිපයක්ම උල්ලංඝනය වී තිබූ බව දැකිය හැකි විණි.

එහිදී,

1) දිවි තොර කරගත් ආකාරය දක්වා ඇත. ඒ ඔස්සේ දිවි තොර කරගැනීමට පෙළඹවීමක් ඇති තවත් අයෙකුට අනුකාරක දිවි තොර කරගැනීමක් සඳහා උත්තේජනයක් සැපයිය හැක.

2) විපතට පත් පුද්ගලයාගේ නම, ලිපිනය ආදී පෞද්ගලික තොරතුරු පුවත් දෙකෙහිම දක්වා තිබුණි. ඒ ඔස්සේ අදාළ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන් තුළ එම සිදුවීම නිසාත්, දිවි තොර කරගැනීම් හා බැඳුනු සමාජ අගතිය නිසාත්, දැනටමත් ඇති වී තිබිය හැකි සිත් වේදනාවන් සහ මානසික පීඩාවන් තවදුරටත් තීව්‍ර විය හැක.

3) උපකාරක අංක සඳහන් වී නැත. උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති ඕනෑම අයෙකුට උපදේශන සේවාවන් වෙත යොමු වීමට පෙළඹවීමක් ඇති කළ හැක. ඒ ඔස්සේ තවත් ජීවිතයක් ගලවා ගැනීමට පිටුවහලක් ලැබෙනු ඇත.

මෙම පුවත් සහෝදර ඉංග්‍රීසි පුවත්පත් වල පළ වී නොතිබුණි.

හදිසි උපකාරක අංක:<br>
CCCline - 1333<br>
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860<br>
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:<br>
https://www.imediaethics.org/the-ethics-of-reporting-on.../<br>
https://ethics.journalists.org/.../mental-health-and.../<br>
https://accountablejournalism.org/.../australia-standards...